# ශ්‍රී ලංකාවේ අභිලේඛනවලින් හෙළිවන මානව අයිතිවාසිකම් පිළිබඳ විමර්ශනයක්

- ගල්වැවේ විමලඛන්ති හිමි

## අරමුණ

නූතන ලෝකයේ මානවයාගේ වටිනාකම හා මානව ක්‍රියාකාරකම් සුරක්ෂිත කිරීමේ වටිනාකම පිළිබඳ උනන්දුව ක්‍රමයෙන් අඩුවෙමින් තිබේ. මානවයා හා ඔහුට මිහිතලය මත ඇති තැන පිළිබඳව විවාදයක් නොමැති වුව ද ලෝකයේ වඩාත් වේගයෙන් ක්‍රියාත්මක වෙමින් පවත්නා අති කුරිරුවූ ද අති බිහිසුණුවූ ද, ත්‍රස්තවාදී ක්‍රියාකාරීන්ගේ බිහිසුණු දඬුවම් ක්‍රම පිළිබඳව විමසීමේදී මේ තත්ත්වය වැඩි වශයෙන් ප්‍රකටව පෙනේ. මේ නිසා නැවතත් මානව හිමිකම් පිළිබඳ විමර්ශනයට ලෝකයාගේ අවධානය යෙදවී ඇති අතර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බැලීමේදී විවිධ යුගයන්හිදී වරද හා දඬුවම පිළිබඳ සංකල්පය ද රාජ නීතිය ද විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වූ අතීතයක් පවතින බව ප්‍රත්‍යක්ෂ වේ. එහෙත් පැරණි රාජ්‍ය පාලන යුග වුව ද සැලකීමේදී රජවරු මානව ක්‍රියාකාරකම් පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව ක්‍රියාත්මක වූ බව පැහැදිලි වේ. මේ ලිපියේ අරමුණ ශිලාලේඛන ආශ්‍රයෙන් මෙරට මානව අයිතිවාසිකම් කෙලෙස ආරක්ෂිතව පැවතියේදැ යි විමර්ශනය කිරීම යි.

## හැඳින්වීම

මිනිස් අයිතිවාසිකම් යනු මොනවා ද යන්න පිළිබඳව විමර්ශනයට ලක් වූයේ මානවයාගේ පරිණාමයත් සමගමය. රැලක නායකයා සතු සුවිශේෂී අයිතිවාසිකම් තිබුණ ද සමස්ත රැල වැසියන් ආරක්ෂා කරගැනීම ඔහුගේ වගකීම වූ බව



පැහැදිලි වේ. ලෝක නිර්මාණය හා පෘතුවිය මත ජීවය සම්බන්ධ බුද්ධ දේශනාව පැහැදිලි වන අග්ගඤ්ඤ සූත්‍රය ආශ්‍රිත දේශනාවේදී රාජ්‍ය සංකල්පයේ ආරම්භය පිළිබඳව කරුණු සඳහන් වෙයි. එහිදී තම වැසියන්ගේ හරි වැරදි හොඳින් විමර්ශනය කොට ඔවුන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීම ද, අවශ්‍ය විධිමත් දඬුවම් නිර්දේශ කිරීම ද රජුගෙන් ඉටුවිය යුතු වූ මෙහෙය වශයෙන් ආරම්භක යුගයේ මිනිසා සැලකූ බව පැහැදිලි වේ.[1] එයින් කියවෙන්නේ සමානත්වය, ශ්‍රේෂ්ඨත්වය හා මානවයා සාමයෙහි පවත්වා ගැනීම් සම්බන්ධයෙන් මානව සංහතියේ ආරම්භක සමයේ සිටම නීති රීති ක්‍රියාත්මකව පැවති බව යි.

වාසෙට්ඨ සූත්‍රයේදී බුදුරදුන් සෑම මනුෂ්‍යයෙක්ම සමාන බව දක්වා තිබේ. මිනිසුන් කෙරෙහි පවත්නේ ව්‍යවහාර මාත්‍ර විවිධත්වයක් බවත්, එබැවින් ඔවුන් සියල්ලන්ම සමාන බවත් දක්වා තිබේ.[2] මේ නිසා බෞද්ධ සමාජය නිරන්තරයෙන්ම අන්‍යයන් පිළිබඳ සමානාත්මතාවයෙන් යුතුව බැලීමට පෙළඹුන බව පැහැදිලි වේ. මානව අයිතිවාසිකම් පිළිබඳව නිර්වචන සපයන නව බ්‍රිටනිකා ශබ්දකෝෂයෙහි යම් පුද්ගලයෙකු ඔහු හෝ ඇය මනුෂ්‍යයෙක් වශයෙන් ඉපදීමෙන් හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වශයෙන් හඳුන්වා දී තිබේ. තව ද විශ්වීය වශයෙන් හා පොදුවේ ගත් කළ ඒවා සියල්ලන්ට ම සමාන විය යුතු බව දක්ව යි.[3]

බෞද්ධ ධර්මයේ උපදෙස් ආශ්‍රයෙන් පෝෂණය වූ ශ්‍රී ලාංකේය සමාජය තුළ ඇත්තේ සමානාත්මතාවාදී ගුණය කි. එබැවින් ශිලාලේඛනයන්හි ද ඒ පිළිබඳව විටින් විට කරුණු සඳහන් වේ. අයිතිවාසිකම් යන වදන ශ්‍රී ලංකාවේ අභිලේඛන ආශ්‍රයෙන් ද හමු වේ. 'සම්වතා පහන' යන වදන පරණවිතානයන් හඳුන්වා ඇත්තේ ''අයිතිවාසිකම් ප්‍රඥප්තිය'' වශයෙනි.[4] අයිතිවාසිකම් හා යුතුකම් වශයෙන් කොටස් දෙකක් සමාජයේ පවතින අතර යුතුකම් මගින් අයිතිවාසිකම් ස්ථාපනය වන ආකාරය ශිලාලේඛන මූලාශ්‍රයයන්ගෙන් සනාථ වේ.

## නීති රීති ස්ථාපනය වූ ආකාරය

නියමයන් ස්ථාපනය වනුයේ සිරිත් ආශ්‍රයෙනි. සිරිතක් යනු කාලයක් තිස්සේ භාවිතව පැවත අවුත් සමාජයේ ස්ථාවර වූ සම්ප්‍රදායය කි. එය පසුව නීතියක් බවට පරිවර්තනය වේ. ඇතැම් නීති හැදෙනුයේ සිරිත් ස්ථාපනය වීම තුළිනි. සමහර නීති කෙටුම්පත් කිරීමෙන් ස්ථාපනය වේ. ශිලාලේඛනයන්හි සිරිත් පිළිබඳව පැහැදිලිව සඳහන් වී තිබේ. ශිලාලේඛනයන්හි **'...වත් සිරිත් නොඉක්ම'**. වශයෙන් සඳහනක් තිබේ. එයින් අදහස් වන්නේ පුරාණයේ සිට පැවත ආ සිරිත් නොඉක්මවියයුතු බව යි. සිරිත නීතියක් වූ බව එයින් පසක් වේ. **"දෙමුළැ බජ්තුවාක් අවසැට් දායකයන් කළ නියත පමණින් වත් සිරිත් නොඉක්මැ වසගින් සඟුන් එළ්වනු ඉසා"** වශයෙන් අනුරාධපුරයේ පිහිටි පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙහි සඳහන් වේ.[5] මෙහි **'වසඟින්'** යනු වස් කාලයේ අවසන් වූවායින් පසුව යන අදහස ගම්‍යමාන වේ. එයින් කියවෙන්නේ පවත්වාගෙන ආ වත් සිරිත් කඩ නොකොට වස් අවසානයේ ද උභය නිකායේ සංඝයාට ප්‍රදානයන් කළ යුතු බව යි. නීති රීති රාශියක් පිළිබඳව තොරතුරු සඳහන් වන සිව්වන මිහිඳු රජුගේ මිහින්තලේ පුවරු ලිපියෙහි ද මේ හා සමාන සඳහනක් තිබේ. පෙර පැවතීගෙන ආ සිරිත් චේතියගිරියෙහි හා අභයගිරි වෙහෙරෙහි නොනවත්වා පවත්වාගෙන යායුතු බව දක්වමින් මෙම ශිලාලිපියෙහි නීති පවත්වාගනෙ යාමෙහි වටිනාකම දක්වා තිබේ.[6] මෙයින් පැහැදිලි වන්නේ පුද්ගලයාගේ අයිතිවාසිකම් ආරක්ෂා වන්නේ පෙර සිරිත් නිවැරදි කොට ආරක්ෂා කර ගැනීමෙන් බව යි. මේ නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතිය බෞද්ධ ධර්මයේ ආභාසය ලැබූ බැවින් මානව අයිතිවාසිකම් මෙන්ම සත්ත්ව හා ශාක සම්බන්ධ අයිතිවාසිකම් ද ආරක්ෂා කර දීමට ඓතිහාසික යුගයේ සිට ම ක්‍රියා කළ බව එයින් ප්‍රකට වේ. මිහින්තලේ පුවරු ලිපියේම ශාකවල ආරක්ෂාව සම්බන්ධයෙන් තීන්දු තීරණ එකල රජවරුන් විසින් ගත් බව සනාථ වේ.[7] මෙයින් ප්‍රකාශ වන්නේ ගස්කොලන්, සතා සිව්පාවුන් ආදී සියල්ලන්ටම ආරක්ෂාව රැකවරණය නීති රීති මගින් එකල සලසා දුන් බව යි.



## ආගමික නිදහස

බුදුසමය මෙරට ස්ථාපනය වන්නටත් පෙර සිට ම ආගමික නිදහස මෙරට ස්ථාපනයවී පැවති බව වංසකථාවන්ගෙන් සනාථ වේ. මහාවංසයෙහි පණ්ඩුකාභය රාජ්‍ය පුවත් දක්වමින් බොහෝ ආගමික නිදහස ලබාදී තිබූ බව සවිස්තරව පැහැදිලි කෙරේ. **"පණ්ඩුකාභය රජු විසින් චිත්තරාජ සඳහා දෙවොලක් ඉදිකරනු ලැබී ය. වලවාමුඛී නම් අස් වෙළඹ සඳහා ද පුදසුනක් ඉදිකරවී ය. පශ්චිමරාජිනිය සඳහා ද ව්‍යාධ දේව සඳහා ද විමනක් ඉදිකරනු ලැබිණි."** මෙලෙස විවිධ ආගමික මතිමතාන්තරවලට වැඳුම් පිදුම් කිරීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමෙන් බුදුසමය මෙරට ස්ථාපනය වන්නට ප්‍රථමයෙන් ද ආගමික නිදහස මෙරට පැවති බවට සාධක එළවේ.[8] පරණවිතාන දක්වන්නේ නාග හා ජලාධිගෘහිත භූතයන් ද ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට නිදහස් ආගමික විශ්වාසයන් වශයෙන් ස්ථාපනය වී පැවති බව යි.[9] මෙම තත්ත්වය බුදුසමය මෙරට පිහිටුවා එය ස්ථාපනය වීමෙන් අනතුරුව ද නොවෙනස්ව පැවති බව සනාථ වේ. වළගම්බා රාජ්‍ය සමයේ මෙරට අභයගිරිය ඉදි කරන ලද්දේ 'ගිරි' නම් නිඝණ්ඨයාගේ දොවොල තිබූ තැන ය. එය ද රජු පැරද පලා යන විට කළ අවමන් නිසා සිදුවූවකි[10]. එක් අතකින් මෙය දේශපාලන පලිගැනීමකි. එහිදී සිදු වන්නේ අයිතිවාසිකම් කඩවීමකි. ඒ හැරුණුවිට තමන් අකමැති අයෙකුට වුව ද කරදරයකින් තොරව වාසය කිරීමට අවස්ථාව තිබූ බව එයින් පැහැදලි වේ. ඒ අනුව ආගමික නිදහස මේ යුගයේ හොඳින් පැවති බව තහවුරු වේ.

මෙම තත්ත්වය අනුරාධපුර යුගයේ අවසන් භාගය වනතුරුම නොවෙනස්ව පැවති බව ශිලාලේඛන සාධකවලින් පැහැදිලි වේ. පළමුවන විජයබාහු රජුගේ (ක්‍රි.ව. 1051-1106) පාලමොට්ටෙයි දෙමළ ශිලාලේඛනයට අනුව ඒ බව වැඩිදුරටත් සනාථ වේ. එහි සඳහන් වන ආකාරයට හින්දු ආගමේ දේව කොට්ඨාශයන්ට රජුගේ පුදපූජාවන් හිමි විය.[11] දෙවන විජයබාහු රජු ද අන්‍යාගමික නිදහස හොඳින් සලසා තිබූ බව බුදුමුත්තාව ටැම් ලිපියෙන් සනාථ වේ.[12] නිශ්ශංකමල්ල රජු ද (ක්‍රි.ව.1187-

1196) අන්‍යාගමික මධ්‍යස්ථානයන්ට ගරු කළ බව ද විවිධ ප්‍රදානයන් සිදුකළ බව ද, ආගමික නිදහස ස්ථායී කළ බව ද කන්තලේ ගල් ආසන ශිලාලේඛනය[13] තුළින් තහවුරු කරයි. අන්‍යාගමික මතවාදයන්ට අමතරව බුදුසමයේ ම නිකායවාදී මතිමතාන්තරයන්ට ද ඉඩකඩ සලසා දී තිබූ බවට සාධක ශිලාලේඛන සාධක ආශ්‍රයෙන් සනාථ කර ගත හැකි ය. ඒ අනුව මහායානවාදී මතයන්ට වැඩි වශයෙන් ගරු කළ බෝසත් වන්දනාවට ද ඉඩ ප්‍රස්ථා වෙන්ව පැවති බව සිව්වන මිහිඳු රජුගේ සිව්වන ජේතවනාරාම පුවරු ලිපියෙන් කරුණු සනාථ වේ.[14] බෝසත් වන්දනය හීනයාන හා මහායාන මතවාද පරස්පරතාව සම්බන්ධ එක් සාධකයකි. එහෙත් අන්‍යාගමික හෝ අන්‍ය නිකායික (නකා) සම්බන්ධතාවයන් ප්‍රතික්ෂේප කිරීමක් මෙරට නොපැවති බව මේ තුළින් ගම්‍යමාන වේ.

## අධ්‍යාපනික නිදහස

මානව අයිතිවාසිකම් පිළිබඳ කථිකාවතේ දී ඉතා වැදගත් අවස්ථාවක් හිමිවන තවත් ප්‍රධාන කරුණක් ලෙස අධ්‍යාපනය හඳුන්වා දිය හැක. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට ම ආගමික වශයෙන් හෝ භාෂාමය වශයෙන් අධ්‍යාපනය ලැබීමේදී වෙනසක් ප්‍රදර්ශනය නොවියයුතු බව නූතනයේ පිළිගත් මතය යි. මේ තත්ත්වය ශ්‍රී ලාංකේය ඓතිහාසික සමාජයේ ද එලෙසම ක්‍රියාත්මකව පැවති බවට සාධක ලැබෙන ශිලාලේඛන කිහිපයක් ම පවතී.

ප්‍රධාන වශයෙන්ම වහරල ශිලාලේඛනයන් අයත් සමාජය පිළිබඳව සලකා බැලීමේදී ක්‍රිස්තුවර්ෂ පස්වන සියවස වන විට මෙරට වැසි සාමාන්‍ය ජනයා අක්ෂර කලාව හා භාෂාව කීමට බිණීමට පමණක් නොව ලිවීමට ද හැකි පිරිසක් වශයෙන් සිටි බව සනාථ වේ. අක්ෂරයන්ගේ විවිධ හැඩතල හා තත් ශිලාලේඛනයන්ගේ විවිධත්වය මෙන්ම කිසිදු රාජ්‍ය අනුග්‍රහයකින් තොරව ඒවා සටහන් කොට තිබීමෙන් ඒ බව වැඩි වශයෙන් ම සනාථ වේ.



භාෂාව හා කලාව මුල් යුගයේ දැන සිටියේ සීමිත පිරිසක් පමණි. ඒ නිසා ස්ථාපනය වී ඇති මුල් කාලීන ශිලාලේඛනයන්ගේ ද විධිමත් බවක් හා පැහැදිලිතාවයක් දර්ශනය වේ. එහෙත් වහරල ශිලාලේඛන අයත් යුගය වන විට ඒ තත්වය වෙනස්ව ගොස් පැවති බව සනාථ වේ. ලැබී ඇති ශිලාලේඛන බොහොමයකම ඇත්තේ සාමාන්‍ය ජනයා සම්බන්ධ විස්තර ය. ඇතැම් පරිත්‍යාගශීලීන් උළුවඩුවන් වැනි විවිධ සමාජ ස්ථරයන් නියෝජනය කළ සාමාන්‍ය පුද්ගලයෝ ය. බරොස් මණ්ඩප සෝපාන පන්තියේ සඳහන් එක් වහරල ශිලාලේඛනයක් පිහිටුවන ලද්දේ උළුවඩුවෙකු වෙනුවෙනි.[15] බොහෝවිට මේ ශිලාලේඛනයන් සනිටුහන් කරන ලද්දේ ද එකී පරිත්‍යාගශීලීන් ම බව ඒවාහි විවිධ අක්ෂර රටාවන් ආශ්‍රයෙන් සනාථ වේ. "**සීගිරි ගී යුගය**" වන විට මේ තත්ත්වය තවත් වර්ධනයවී ගොස් සාමාන්‍යා ජනයා උගත් කලා රසිකයන් වී සිටි බව සනාථ වේ. මේ සඳහා අධ්‍යාපනයේ අයිතිය සැමට හිමිවිය යුතු වේ. අධ්‍යාපනය ලැබීමට හැකියාව මුල් යුගයේ ලැබුනේ රාජ්‍ය නිලධාරීන් හෝ රජයට සම්බන්ධ පිරිස්වලට හා ආගමට සම්බන්ධ පිරිස්වලට පමණි. එහෙත් පසුකාලීනව ඒ තත්ත්වය වෙනස්ව ගොස් පැවතිණ.

බෞද්ධ ධර්මය සම්බන්ධයෙන් විමසීමේදී මුල් යුගයේ අධ්‍යාපනයේ නිදහස යම් පමණකට සීමාවී පැවති බවට පෙනෙන සාධකයක් වෝහාරතිස්ස රාජ්‍ය අවධියෙන් සනාථ වේ. එහෙත් එය වංසකථා ආශ්‍රිත පුවතකි. තව ද මහාවංසය රචනා කළ මහානාම හිමියන් මහාවිහාර වංශිකයෙක් වූ නිසා ම වෝහාරතිස්ස රාජ්‍ය සමයේ සිදුවූ වෛතුල්‍යවාදය සහිත ලේඛන ගිනි තැබීම අධ්‍යාපනයේ නිදහස එකල්හි ස්ථාපනය වී නොතිබූ බවට සාධකයක් වශයෙන් දැක්විය හැකි ය. එහෙත් එය බුදුසමයේ නිකායයන් අතර පැවති ගැටුමක ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් එම යුගයේදී වෛතුල්‍යවාදය සහිත ලේඛන කපිල නම් අමාත්‍යයෙකු මගින් විභාග කරවා ගිනි ලැවීමට ක්‍රියාකළ බව මහාවංසයේ සටහන්ව තිබීමෙන් ඒ බව සනාථ වේ.[16] එහෙත් දකුණු ඉන්දියාවේ නාගාර්ජුනකොණ්ඩ විහාරයේ පවතින ශිලාලේඛන ආශ්‍රයෙන් සනාථ වන්නේ මීට වඩා වෙනස්

තත්ත්වයකි. එහි හීනයාන මහායාන මතිමතාන්තරයන් එකම ආරාම සංකීර්ණයේ වුව ද බාධාවකින් තොරව ක්‍රියාත්මකව පැවති බවට සාධක ලැබේ. එහි මෙරට භික්ෂූන් වෙනුවෙන් වෙන්වූ ආරාම සංකීර්ණයක් ද එකළ පැවති බව සනාථ වේ. එහි අභයගිරි, ජේතවන, මහාවිහාර යන ආරාමත්‍රයේ ම භික්ෂූන් වාසය කළ බවට සාධක පවතී.[17] ඒ අනුව වෝහාරතිස්ස රාජ්‍ය සමයේ වෛතුල්‍යවාදී ග්‍රන්ථ ගිනිලෑම අධ්‍යාපනික අයිතිය සීමාවීමක් වශයෙන් ඇතැම්විට අර්ථකථනය කළ හැකි ය.

පස්වන කාශ්‍යප රජුගේ (ක්‍රි.ව.920-939) අනුරාධපුර පුවරු ලිපියට අනුව විහාර සන්තක දේපල වංචනිකව අත්පත් කර ගන්නේනම් එබඳු භික්ෂූන් සිව්රු හරවා පිටත් කළ යුතු බව තත්කාලීන නීතියක් වශයෙන් ස්ථාපනයවී පැවතිණ.[18] තව ද ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් හා භික්ෂූන් සහිත සභාවක් මගින් චෝදනාව විභාග කොට බැලිය යුතු බව දැක්වීමෙන් වරදින් නිදහස්වීමේ අයිතිවාසිකම් එකල ආරක්ෂාවී පැවති බව සනාථ වේ.

ගිහියන් පමණක් නොව භික්ෂූන් වහන්සේලාගේ දැනුම පිළිබඳව විමසීමේදී එම යුගයේ අධ්‍යාපනික තත්ත්වය උසස් මට්ටමක පැවති බව සනාථ වේ. භික්ෂූන්ට ලෞකික විෂයයන් හැදෑරීමට වුව තහනමක් නොපැවති බව නන්ද තෙරුන්ගේ කතරගම පුවරු ලිපියෙන් සනාථ වේ.[19] එම තෙරුන් චෛතිය විශාල කිරීමටත්, සිව් ද්වාර සකස් කිරීමටත් තරම් දැනුම් සම්භාරයකින් සිටි බව මෙයින් පැහැදිලි වේ. ඒ වාස්තු විද්‍යාඥාණය සම්බන්ධයෙනි. ලෞකික විෂයයන් ඉගෙනීමට හා එකී දැනුම ක්‍රියාත්මක කිරීමට උන් වහන්සේට භික්ෂුත්වය බාධාවක් නොවී ය.

නිශ්ශංකමල්ල (ක්‍රි.ව. 1189-1198) රජුගේ දඹුලු ගිරි ලිපියට අනුව භික්ෂූන් වහන්සේලාට සිය ත්‍රිපිටක ධර්මය පමණක් නොව බාහිර ශාස්ත්‍රඥාණය ද ලබා දීමට අවශ්‍ය පහසුකම් රජු විසින් සලසා දුන් බව කියවෙයි.[20] එයින් පැහැදලි වන්නේ අධ්‍යාපනය සම්බන්ධ අයිතිය තහවුරු කිරීමට රජු ක්‍රියා කළ බව යි.



මූල බ්‍රාහ්මී අභිලේඛනයන්හි ද **"පටිබනකුට"** වශයෙන් යෙදුමක් තිබේ. එහි අර්ථය ප්‍රතිභානය හෝ කටපාඩම් කිරීම යි. මෙය භික්ෂූන් වහන්සේලා තෙවලා දහම හෝ වෙනත් වාචෝද්ගත කළ දේ අමතකවීම වැලැක්වීම සඳහා රාශිභූතව ඒවා කියවීම වෙනුවෙන් භාවිත වචනය කි.[21] බෞද්ධ භික්ෂූන්ගේ දින චර්යාවෙහි මෙය ද කොටසක් වශයෙන් සලකනු ලැබේ. එහෙත් එය එක්ව ගෙන ශාස්ත්‍ර හැදෑරීම සඳහා බුදුසමය ආරම්භක යුගයේදීම සියලූම භික්ෂූන් වෙනුවෙන් පැවති උරුමයක් වශයෙන් ද පෙන්වා දිය හැකි ය. එයින් සනාථ වන්නේ අධ්‍යාපන අයිතිය සැමට සාධාරණ ලෙස ක්‍රියාත්මකව පැවති බව යි.

සිව්වන මිහිඳු රජුගේ මිහින්තලේ දෙවන පුවරුලිපියෙහි භික්ෂූන් වෙනුවෙන් ගිහියන් ඉගැන්වීමෙහි යෙදී සිටි බව ද ඔවුන්ට වේතනයන් වශයෙන් **'කිරිය'** ප්‍රදානය කරන ලද බව ද පැහැදිලි කර දී තිබේ.[22] මෙයින් කියවෙන්නේ පැවිද්දන්ට ඉගැන්වීම සඳහා ගිහියන් ද සිටි බව යි.

**ජීවත් වීමේ නිදහස හා සෞඛ්‍යාරක්ෂිත ජීවිතයක් ගෙවීමේ නිදහස**

දුකට පත් ජනතාවට පිහිට වීම රාජ්‍යයක මූලික පරමාර්ථයක් වේ. රාජ්‍ය පාලකයාගෙන් මූලික වශයෙන් බලාපොරොත්තු වූයේ එබන්ද කි. මේ අනුව දුකට පත් ජනයා සොයා බලා ඔවුන්ගේ දුක නිවීමට ක්‍රියා කිරීමට රජවරුන් ක්‍රියා කළ ආකාරය වංසකථාවන්හි හා ශිලාලේඛනයන්හි සටහන්ව තිබේ. දුකට පත්වූවන් සුඛිත මුදිත කිරීම වෙනුවෙන් විවිධ අණපනත් පැවතිණ. අන්ධයන්ට, කොරුන්ට, ගැබිණි මාතාවන්ට පමණක් නොව සතුන්ටත් සැලකිලි දැක්විය යුතු බව මහාවංසයෙහි සටහන්ව තිබේ. පළමුවන උපතිස්ස රජු (ක්‍රි.ව. 368 - 410)[23] බුද්ධදාස රජු (ක්‍රි.ව.335 - 365 )[24] දෙවන දප්පුල රජු (ක්‍රි.ව.625-830)[25] පළමුවන විජයබාහු රජු (ක්‍රි.ව. 1076-1114)[26]

මෙලෙස දුකට පත් ජනතාව හා සත්වයන් වෙනුවෙන් ක්‍රියා කොට ඇති බව වංශකථාවන්හි දැක්වේ.

රටවැසියාගේ සෞඛ්‍ය තත්වය උසස් කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වීම පාලකයන්ගේ කාර්යභාරයකි. රටවැසියාට ද සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගෙවීම පිළිබඳ අයිතිවාසිකමක් තිබේ. අතීත රජවරුන් ද සෞඛ්‍ය වෙනුවෙන් ක්‍රියාත්මක වූ බවට වංශකථා ආදියෙහි ප්‍රමාණවත් තොරතුරු සටහන් වේ. දුටුගැමුණු මහරජතුමා (ක්‍රි.පූ.161-167) ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාත්මක වූයේ මහදාගැබ්හි මිල නොදී කිසිවෙකුගෙන් වැඩ නොගත්තේ ය. රටවැසියන්ගේ සේවයට වටින වේතනයක් ගෙවූ බව එයින් පැහැදිලි වේ. තමන් කරන රාජ කාර්යයට සමාන වැටුපක් ලැබීම මානව අයිතිවාසිකම් සුරක්ෂිත වීමකි.[27] වෝහාරතිස්ස රජතෙමේ පංච මහා වාසයෙහි රෝගාතුරවූවන්ට පිළියම් කළ බව මහාවංසයෙහි සටහන් වේ.[28] බොහෝ ධාර්මික රජවරු රෝගයන්ට ලක් වූවන්ට පිළියම් කිරීම තම යුතුකමක් සේ සැලකූ බව ද, එබඳු සම්ප්‍රදායයක් මෙරට රජවරුන් අතර පැවති බව ද එයින් සනාථ වේ. බුද්ධදාස රජතුමා (ක්‍රි.ව. 340-360) මිනිසුන් වෙනුවෙන් පමණක් නොව සතුන් වෙනුවෙන් ද වෛද්‍ය ශාලා පිහිට වූ රජකෙනෙකි.[29] එපමණක් නොව එතුමා ප්‍රකට වෛද්‍යවරයෙක් ද වේ. පස්වන කාශ්‍යප රජු පොළොන්නරුවේ වෛද්‍ය ශාලා කරවූ බව මහාවංසයේ සටහන්ව තිබේ.[30] පරාක්‍රමබාහු රජු රෝගීන් වෙනුවෙන් වෛද්‍ය ශාලාවක් කරවා එහි නඩත්තු කටයුතු වෙනුවෙන් ද ක්‍රියා කොට තිබේ.[31]

ශිලාලේඛනයන්හි ද වෛද්‍ය කර්මය හා ඒ තුළින් මහජනයාගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීමට රජවරුන් ක්‍රියා කළ ආකාරය පිළිබඳ සාධක හමු වේ. මූල බ්‍රාහ්මී අභිලේඛනයන්හි වෛද්‍යවරු සිටි බවට සාධක හමු වේ. මගුල් මහා විහාර තෙවන ශිලාලේඛනයෙහි වෛද්‍යවරයෙක් පිළිබඳව කියවේ.[32] පිච්චන්දියාව පළමු ශිලාලේඛනයෙහි[33] ගාමිණී තිස්ස රජුගේ වෛද්‍යවරයෙක් පිළිබඳව සඳහනක් තිබේ. රාජාංගණයෙහි හත්පීකුච්ඡි විහාරයේ පිහිටි ශිලාලේඛනයක ද



වෛද්‍යවරයෙක් පිළිබඳව සඳහන් වේ.[34] එම යුගයේ හෙවත් මූල බ්‍රාහ්මී යුගයේ වෛද්‍ය කර්මය පිළිබඳව වැඩි විස්තරයක් නැත ද ශිලාලේඛනවල වෛද්‍යවරු පිළිබඳව සඳහන් වීමෙන් ඔවුන්ගේ සේවය ගම් නියම්ගම්හි පැතිර පැවති බව සිතීමට අවකාශ සැලසේ.

කිරිබත්වෙහෙර ටැම් ලිපියට අනුව සිව්වන කාශ්‍යප රාජ්‍ය සමයේ (ක්‍රි.ව.890-914) රජුගේ නියමයෙන් වෛද්‍යශාලාවකට ලබාදුන් වරප්‍රසාදාදිය පිළබඳව සඳහනක් තිබේ.[35] මෙම ලේඛනයේ ඇති විශේෂතාවයක් වන්නේ "**බෙහෙද් ගෙට්**" හෙවත් ආරෝග්‍ය ශාලාවට ලබා දුන් පරිත්‍යාගයන් හා සීමා පැහැදිලිව නියම කොට පරිත්‍යාග කොට තිබීම යි. සිව් දිගින් සීමා නිර්ණය කොට ඉතා පැහැදිලිව මෙම පරිත්‍යාග සිදු කොට තිබේ.

සිව්වන කාශ්‍යප රජුට අයත් කොළඹ කෞතුකාගාර ටැම් ලිපියේ තිඹිරිගෙයකට කරන ලද පරිත්‍යාගයන් පිළිබඳව සඳහනක් තිබේ.[36] තත්කාලයේ ඇති වෛද්‍ය කර්මයන් සඳහා රජවරුන් නිරන්තරයෙන්ම අවධානයෙන් පසු බව ද බෙහෙත් හේත් ලබා දීම හා වෛද්‍ය කර්මය මූලික මිනිස් අවශ්‍යතාවයක් සේ සලකා ක්‍රියා කළ බව ද එයින් පැහැදිලි වේ.

දොරබාවිල විහාරස්ථානයේ ටැම් ලිපියක පස්වන කාශ්‍යප රජු විසින් (අනුරපුර) ඇතුළු නුවර ඉදිකළ රෝහලකට කරන ලද පරිත්‍යාගයන් පිළිබඳව සඳහනක් තිබේ.[37] සී.ඊ.ගොඩකුඹුර විශ්වාස කරන්නේ මෙහි සඳහන් ඇතුළු නුවර යනු අනුරාධපුර ඇතුළු නුවර බව යි.[38] එහි දෙවන පුවරු ලිපියෙහි,"**පුනල්නාවන්**" නම්වූ මහ වෙදදුරු සඳහා ගම් බිම් පරිත්‍යාග කළ ආකාරය දැක්වෙයි.[39] මෙම තොරතුරුවලින් සනාථ වන්නේ මානවයාගේ සෞඛ්‍යාරක්ෂිත බව සඳහා පාලකයන් උනන්දු වූ ආකාරය හා එහි අඛණ්ඩ පැවැත්ම වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බව යි.

වෛද්‍ය ශාස්ත්‍රය වෘත්තියක් වශයෙන් රජ අනුහසින් සම්පත් භුක්තිවිඳි රැකියාවක් බවට පරිවර්තනයවී පැවති බව සයවැනි මිහිඳු රජුගේ මැදිරිගිරි පුවරු ශිලාලේඛනයෙන් තහවුරු වෙයි. එහි වෙදහලක් පවත්වාගෙන යාමට සම්පත් ප්‍රදානය කර ඇති බව ද, වෛද්‍යවරුන් අනියමින් හෝ අල්ලස් වශයෙන් හෝ යමක් නොගතයුතු බව ද පැහැදිලිව සටහන් කොට තිබේ. ආරෝග්‍ය ශාලාවේ නිලධාරීන් විහාර සන්තක භූමියෙහි වගා නොකළයුතු බව ද, ආරෝග්‍ය ශාලාවේ බඳුකරුවන් ලවා ආරාම වතු වගා නොකළ යුතු බව ද, වෛද්‍ය ශාලාවට අළලා ඇති ඉඩම්වල වෛද්‍ය නිලධාරීන් වගා නොකළ යුතු බව ද බඳුකරුවන්ගෙන් ත්‍යාග හෝ මුදල් වෛද්‍ය කර්මයේ දී භාර නොගත යුතු බව ද එහි සවිස්තර වශයෙන් සටහන් කොට තිබේ. මෙයින් සනාථ වන්නේ වෛද්‍ය වෘත්තිකයන්ට පමුණු ඉඩම් හා රජයෙන් සම්පත් ප්‍රදානය කර ඇති බැවින් ගිලනුන්ගෙන් හෝ වෙනත් පුද්ගලයින්ගෙන් මිල හෝ ත්‍යාග භාර නොගත යුතු ලෙස රජු විසින් ම නියෝග කර ඇති බව යි. තව ද සෞඛ්‍ය සඳහා අයිතියක් පැහැදිලිවම රටවැසියාට අයත්ව පැවති බව ද මෙයින් පැහැදිලිව සනාථ වේ.[40] මැදිරිගිරිය ශිලාලේඛනයට අනුව පැහැදිලි වන්නේ වෛද්‍යවරුන්ට ගෙවීම් ආදිය පැවති බව යි. වෙනත් තුටු පඬුරු භාර නොගතයුතු බව දක්වන්නේ ඒ නිසා ය. ඒ බව වැඩි දුරටත් සනාථ වන ලේඛනයක් වශයෙන් සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිය දැක්විය හැකි ය. එහි සඳහන් වන ආකාරයට වෙදැදුරෙකුට **දෙතිසැසෙනෙන් නියපැලියක්** ලබා දුන් බව කියවේ. මෙහි **දෙතිසැසෙන** නම් ස්ථානයෙන් **නිය පැලියක් ද, දම්යෙන් වසඟක්** ද (දම්ය ගමෙන් පැළක්) ලබා දුන් බව කියවේ. මෙහි **වසගක්** යනු වර්ෂාග්‍රයෙහි නොහොත් වස් කාලයෙහි කෙළවර යනු යි. එහෙත් එම අදහස පැහැදිලි නැත. කෙසේ වෙතත් පැරණි වෙදැදුරෙක්හට **පය දෙකක්** හා දම්යෙන් **වසගක් (දම්ය ගමෙන් පැළක්)** ලබා දුන් බව කියවේ. මේ නිසා වෛද්‍යවරුන්ට නියමිත වැටුප් පරිමාණයක් පැවති බව සනාථ වේ.[41] මේ සියල්ලකින් ම පරිපාලක රජවරුන් අපේක්ෂා කරන ලද්දේ මහජනයාගේ සෞඛ්‍ය සම්පන්න බව ස්ථාපනය කිරීම යි.



පොළොන්නරුවේ රජකළ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලාලේඛනයෙහි දැක්වෙන ආකාරයට දුකට පත් ජනයා වෙනුවෙන් රක්ෂාවරණය සැලසීම හා ඔවුන්ගේ ඕනෑ එපාකම් සොයා බැලීම ද රජුගේ එක් කටයුත්තක් වූ බව පැහැදිලි වේ.[42]

## ආර්ථික නිදහස

මානවයාගේ උරුමයන් අතරත යහපත් ආර්ථික තත්ත්වයක් පවත්වාගෙන යාමේ අයිතිය ද ස්ථාවර කර දීම රාජ්‍යයක යුතුකම වේ. බදු පනවා ජනයාගේ අවශ්‍යතා සපයා දීමට ක්‍රියා කිරීම අතීත රජවරුන්ගේ ලක්ෂණයකි. රටවැසියාගේ ප්‍රයෝජනය සඳහා පැනවූ බදු සම්බන්ධයෙන් පුවත් රාශියක් ශිලාලේඛනයන්හි සටහන් වී තිබේ. **"පති"** හා **"බලි"** යන වදන්වලින් බදු එකල හඳුන්වා ඇත. පශ්චාත් බ්‍රාහ්මී අවධිය (ක්‍රි.ව. 1-5 සියවස්) මේ සම්බන්ධයෙන් වැඩි තොරතුරු ප්‍රමාණයක් දැකිය හැකි යුගයකි. බොහෝවිට ම ශිලාලේඛනවල සටහන්ව ඇත්තේ විවිධ බදු වෙහෙර විහාරස්ථානයන් වෙත පරිත්‍යාග කිරීම් ය. පුවරසන්කුලම් ගිරි ලිපියෙහි විහාරයට පිදූ විවිධ වැව් අමුණු ආදියෙහි බදු පිළිබඳව විස්තර දැක්වේ.[43] කාටත් සමාන ලෙස බදු අයකිරීම මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමකි. මෙය රජු ආදී උසස්ම පාලකයන්ට ද සමාන ලෙස ක්‍රියාත්මක වීමෙන් ඒ බව පැහැදිලි වේ. නූතනයේදී ද සැමට සමාන ලෙස නීතිය ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් කාගේත් අවධානය යොමුව තිබේ.

පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ සඳහන් වන ආකාරයට රට සමෘධිමත් කිරීම සඳහා කර්මාන්ත ආදිය සුලභ කළ යුතු බව රජවරුන් විසින්ම පිළිගෙන තිබිණ. වෙදහල් සුලභ කොට රෝග බිය දුරු කළ බව ද, වැව් ආදිය සකස් කොට ශෂ්‍ය වර්ධනය කිරීමෙන් ශෂ්‍ය සුලභ කළ බව ද, සාගිනි බිය දුරු කළ බව ද, මේ ශිලාලේඛනයෙහි දැක්වේ. එයින් කියවෙනුයේ මානව අයිතිවාසිකමක් වශයනේ සැලකෙන සියලු ආවශ්‍යතා සකස්කර දීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉටු කළ බව යි. තව ද සොර සතුරු බිය ද දුරු කළ බව එහි සඳහන්ව

තිබේ. මානව අයිතිවාසිකම් අතර සිය වස්තුව හා ජීවිතය සඳහා පැවතිය යුතු රක්ෂාවරණය සලසා දීම පාලකයින්ගේ වගකීමක් වන අතර අතීත රජවරුන් විසින් එකී වගකීම ඉටු කළ බව මෙයින් ප්‍රකාශ වේ.[44] මේ හා සමාන විස්තරයක් නිශ්ශංකමල්ල රජුගේ ශිලාලේඛනයන්හි ද එම රජු විසින් රටෙහි දුර්භික්ෂය දුරු කළ බව දක්වා තිබේ. නිශ්ශංකමල්ල රජුගේ පොළොන්නරුව ප්‍රීති දාන මණ්ඩලප ශිලාලේඛනයෙහි දුර්භික්ෂය දුරු කළ අයුරු සටහන් කොට තිබේ.[45] මෙම ශිලාලේඛනයෙහි ම නීතියේ ආධිපත්‍යය ස්ථාපනය කිරීමට රජු ක්‍රියා කළ බව ද සඳහන් කරයි. මානව අයිතිවාසිකම් අතරත නීතියේ ආධිපත්‍යය සැමට සමාන ලෙස ලැබීම ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙෂ සලකනු ලැබේ.[46]

## නීතියේ නිදහස

වරද හා දඬුවම පිළිබඳ සංකල්ප ද නූතනයේ මෙන් අතීතයේදී ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පැවතිය කි. රාජ දණ්ඩනය තුළින් නීත්‍යානුකූලව පුද්ගලයින් මරා දැමිය හැකි ය. ඒ සඳහා ධර්මාධිකරණයෙන් තීන්දුවක් ලබා ගත යුතු වේ. යමෙක් තවත් අයෙකුගේ ජීවිතය තොර කරන්නේනම් එම පුද්ගලයා ද එබඳුම දඬුවමකට යටත් කළ යුතු බව රාජ නීතියේ ද සටහන්ව පැවතිණ. මරණ දණ්ඩනය ක්‍රියාත්මක කළ හැකි වූයේ රජුට පමණි. සිව්වැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව. 1026-1042) වේවැල්කැටිය ශිලාලේඛනයේ[47] මේ බව පැහැදිලිව සටහන් කර තිබේ. එම ශිලාලිපියේ ම සොරකම් කොට අසුවූවහුට වරද ඔප්පුවීමෙන් එල්ලුම්ගස නියම කළ බව සඳහන් වේ. තව ද දඬුවම් ආදිය නිවැරදිව විනිශ්චය සභාවක් මගින් විනිශ්චය කිරීමකින් අනතුරුව මෙකී දඬුවම් ක්‍රියාත්මක කළ බව පැහැදිලිව එහි සටහන් කර තිබේ. දින හතලිස් පහකින් සොරා අල්වා ගත නොහැකි වූයේ නම් රාජ්‍යයට රන් කලන් එකසිය විසි පහක් (125) **දසගම්න්** ලබා දිය යුතු බව ද එහි සටහන් වේ.[48] සිව්වන දප්පුල රජුගේ කොණ්ඩවට්ටවන් ටැම් ලිපියට අනුව මිනීමැරුමක් කළ අයෙක් වෙත්නම් ඔහුව **උල්වාඩු** නම් නිලධරයාට භාර කළ යුතු වේ.[49] මේ අනුව ශ්‍රී ලාංකේය අභිලේඛනවලින් අතීතයේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ඉතා



ඉහලින් ක්‍රියාත්මකව පැවති බවත්, නූතන තත්ත්වය තරමට ම එහි වටිනාකමක් ගැබ්ව පැවති බවත් මෙයින් පැහැදිලි වේ.

පස්වැනි කාශ්‍යප රජුට (ක්‍රි.ව. 914-923) අයත් දොරබාවිල පළමු ටැම් ලිපියෙහි දැක්වෙන ආකාරයට මිනී මැරීමක් කළ අයෙක් ගමට නොවැද්දගතයුතු අතර ගමෙහි විසීමට අවකාශ දීම ද නොකළ යුත්තක් බව දැක්වේ.[50] එයින් පැහැදිලි වන්නේ මිනීමරුවන් ආරක්ෂා කිරීම නොකළ බව යි. රාජ්‍ය දඬුවම්වලට අනිවාර්යයෙන් ම ලක්වීමට සිදුවූ බව ද එයින් ප්‍රකට වේ. මිනී මරුවන් සඳහා ආරක්ෂාවක් නොවීම ඔවුන්ට අයත් රාජ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට බෙහෙවින්ම උපකාරී වන්නක් වේ. මේ බව සිව්වැනි මිහිඳු රජතුමාට (ක්‍රි.ව. 954 -970) අයත් කළුදියපොකුණ දෙවන ලිපියෙන් ද තහවුරු වෙයි. එහි කිසියම් තැනක මිනී මැරීමක් කළ අයෙක් වෙත්නම් ඔහු විහාර බිමට නොවැද්දගත යුතු බව දක්වා තිබේ.[51] පස්වැනි කාශ්‍යප රජුගේ (ක්‍රි.ව. 929-939) අභයගිරි පුවරු ලිපියේ ද මේ හා සමාන නියෝගයක් තිබේ. යමෙක් මිණී මැරීමක් කොට විහාරස්ථානයකට ඇතුළු වී ඇත්නම් ඔහු දඹදිව[52] වෙත පිටත් කර හැරිය යුතු බව දක්වා තිබේ.[53] මෙයින් තවත් දඬුවමක් පිළිබඳව කරුණු අනාවරණය වේ. එනම් පිටුවහල් කිරීම සම්බන්ධව යි. මිණී මරා විහාරස්ථානයක සැඟව සිටියේනම් දඹදිව වෙත පිටත් කර හැරිය යුතු බව එයින් පැහැදිලි වේ.[54] තව ද ඔහු වෙනත් වරදක් කොට විහාර බිමට ඇතුළු වී ඇත්නම් එම දඬුවම ක්‍රියාත්මක නොවිය යුතු බව ද එහි දක්වා තිබේ. එසේ ම දඬුවම ක්‍රියාත්මක කිරීමේදී සැඟව සිටි සැකකරුට හැර ගෙවල් හිමියාට දඬුවම් නොකළයුතු බව එහි ම දක්වා තිබේ.[55] මෙයින් පැහැදිලි වන්නේ දඬුවම් ලබාදීමේ දී අහිංසකයන් නිදහස් කළ බව යි. එහෙත් නූතනයේ පවතින නිතියට අනුව වරදකරුවන්ට රැකවරණය සැපයීම දඬුවම් විඳිය යුතු වරදකි. මේ ශිලා ලිපියේ දැක්වෙන කරුණුවලට අනුව පෙනී යන්නේ වරදකරුවන් අල්වා දීම ද ගම්මුන්ට අයත් කාර්යයක් වන බැවින් ගෙහිමියාගේ උවමනාවෙන් වරදකරුවන් ඔහුගේ නිවසෙහි සඟවාගෙන නොසිටි බව යි. ප්‍රකට බදුලු ටැම් ලිපියෙහි රාජ්‍ය නිලධාරීන් අහිංසක ගම් වැසියනට හිරිහැර නොකළ යුතු බව දක්වා තිබේ.[56]

පුරවැසියන්ට ස්වාධීනව රාජ්‍ය නිලධාරීන්ගේ ගැහැටවලින් මිදී ජීවත් වීමේ අයිතිය මේ මගින් සනාථ කර තිබූ බව පැහැදිලි වේ.

සිව්වැනි කාශ්‍යප රජුගේ මොරගොඩ පුවරු ලිපියට අනුව ගමකට යම් මිනී මරුවෙකු පැමිණියහොත් ඔහුට නවාතැන් නොදිය යුතු ය. එසේම ගමෙහි යම් මිනී මරුවෙක් සිටීනම් ඔහු ගමෙන් පිටත් කළ යුතු ය. මිණී මරා ගමට ඇතුළු වුවහොත් ඇතුළු වීමට ඉඩ නොදිය යුතු ය.[57] මෙයින් පැහැදිලි වන්නේ මිනී මරුවන්ට කිසිදු ආකාරයක බුරුලක් ගමෙන් නොලැබිය යුතු බව යි. එබන්දෙක් ගමෙහි වාසය කරන්නේනම් ගමෙන් පිටත් කිරීම ද කළ යුතු ය. මෙකී ශිලාලේඛනයන්ගෙන් පැහැදිලි වන වඩාත් නිරවුල් නීති ක්‍රියාත්මක කිරීමෙ ක්‍රමවේදයක් වන්නේ ගම්මාන වශයෙන් එහි ආරක්ෂාව හා පැවැත්ම තකා අභ්‍යන්තරික ආරක්ෂාකාරී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මකව පැවති බවයි. පස්වන කාශ්‍යප රජුගේ (ක්‍රි.ව. 980-990) මැදිරිගිරිය ටැම් ලිපියේ ද මේ සම්බන්ධ සඳහනක් තිබේ. එහි දක්වා ඇත්තේ මිණී මරා පැමිණියවුන් ගමින් පිටත් කරනු විනා ගමට වැද්ද නොගත යුතු බවයි.[58]

රටක මහජනයාගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීමට නම් නීතියේ ආධිපත්‍යය සැමට පළමුවෙන් සුරක්ෂිත විය යුතු ය. නීතිය සැමට සාධාරණ විය යුතු ය. එසේ නොවන අවස්ථාවලදී සිදුවන්නේ නීතියට ගරු නොකරනු ලබන පිරිසක් ඇති වීම යි. හෝපිටිගමු වෙළඳ නගරයේ කටයුතු සිදුවිය යුතු ආකාරය දැක්වෙන බදුලු ටැම් ලිපියෙහි නීතියේ ස්වාධිපත්‍යය හොඳින් මෙරට ආරක්ෂිතව පැවති බව සනාථ වන නියෝග තිබේ. දඩ මුදල් ආදිය ලබා ගත යුත්තේ නීතියේ සඳහන් වන ආකාරයට ය. එසේ නොමැතිව නිලධාරීන් නියෝග කඩ නොකළ යුතු බව එහි දක්වා තිබේ. මෙහි පෙර සිරිත් කඩ නොකොට නීති ක්‍රියාත්මක කිරීම හෙවත් සම්ප්‍රදායය නො ඉක්මවා නීති ක්‍රියාත්මක කිරීම[59] ව්‍යවස්ථා නොඉක්මවා නීති ක්‍රියාත්මක කිරීම,[60] නීති ක්‍රියාත්මක කිරීමේදී නීති කඩ නොකිරීම,[61] නීති ක්‍රියාත්මක ගම් වැසියන්ට හෝ ගෙවැස්සන්ට බලපෑමක් නොවන පරිදි ගැනීම නොහොත් බලපෑම් කොට නීතිය ක්‍රියාත්මක වන තැනට වැඩ සිද්ධ



නොකිරීම,[62] නීතිය ක්‍රියාත්මක කිරීමේදී ගෙහිමියා හෝ දඩ ගෙවිය යුත්තා මිස අඹු දරුවන් වැනි යටත් වැසියන්ගෙන් නොගත යුතු බව හෙවත් නීතිය ක්‍රියාත්මක කිරීමේදී එහි පාරිශුද්ධභාවය පිළිබඳව ද[63] මෙහි කරුණු දක්වා තිබේ. මේ අනුව නීතිය සැමට සමාන විය යුතු බව මෙන් ම එය ක්‍රියාත්මක කිරීමෙහිදී පැවතිය යුතු විනිවිද පෙනෙන ස්වභාවය පිළිබඳව ද මෙහි සාකච්ඡා කොට තිබේ. නීතිය ක්‍රියාත්මක කරන්නන් ද වැරදි සිදුකළ හොත් දඬුවම් නියම ව පැවති බව මෙම ශිලාලේඛනයෙන් පැහැදිලි වේ.[64]

## දේපළ අයිතිවාසිකම්

රටක ජනතාවගේ ශාරීරික හා මානසික අයිතිවාසිකම් මෙන්ම ඔවුන්ගේ දේපළ පිළිබඳ අයිතිවාසිකම් ද ආරක්ෂා විය යුතු ය. අතීත රාජ්‍ය පාලන යුගයේදී ද එකී අයිතිවාසිකම් හොඳින් ආරක්ෂා වීමට අවශ්‍ය නීති රීති රජවරුන් විසින් අනුමත කොට තිබූ බව පැහැදිලි වේ. අභිලේඛනයන්හි සඳහන් වන ආකාරයට පුද්ගල අයිතිවාසිකම් මෙන් ම ඔවුන්ගේ දේපළ පිළිබඳ අයිතිවාසිකම් හා ඒවා නිදහසේ භුක්ති විඳීමට ඇති අයිතිය ද ආරක්ෂා වූ ආකාරය පැහැදිලි වේ.

සුභ රජතුමා (ක්‍රි.ව. 60-67) උප්පලදෝණික වැව කහවණු පන් සියයක් වැය කොට මිලදීගෙන එහි ආදායම වැය කොට එකදොරික විහාරයේ පොහොයගේ කරවූ බව සඳහන් වේ.[65] එයින් පැහැදිලි වන්නේ රජු සියලුම වස්තුවේ හිමිකරුවා නොවූ බවයි. රජුට උවත් දේපළක් විකිණීමට රටවැසියාට හිමිකමක් තිබිණ. ඔහු වුව ද වැව මිලදී ගත් හෙයින් ඕනෑම කෙනෙකුට වැව් මිලදී ගත හැකි නිදහසක් තිබූ බව එයින් පැහැදිලි වේ. විලේවැව ගිරි ලිපියෙහි දැක්වෙන ආකාරයට පුද්ගලික හිමිකමට වැව් ආදිය ලබා ගත හැකිව තිබිණ. එහි සඳහන් වන්නේ ගාමණී අභයගේ (රජුගේ) මව් කහවණු හාරදහසක් වියදම් කොට කුබරගම වැව මිලදී ගෙන එය තමාගේ නමින් වූ විහාරයේ සංඝයාට පරිත්‍යාග කළ බවයි.[66] මෙහි සඳහන්වන ගාමණී අභයගේ මව වන්නේ සුභ රජුගේ දියණියයි.[67] මහාවංසයෙහි

දැක්වෙන ආකාරයට ගජබා රජුගේ මව විවිධ ස්ථානයන්ගෙන් මිලදී ගත් දේ සංඝ භෝග කොට දුන් බව සනාථ වේ.[68] සාමාන්‍ය ජනයාට ද වැව් ආදියෙහි අයිතිය පැවති බව සනාථ කෙරෙන විස්තර අඩංගු තවත් ගිරි ලිපියකි පෙරමියන්කුලම ලිපිය. එහි (වසභ) රජුගේ (ක්‍රි.ව.67-111) ප්‍රදානයන්ට අමතරව භාණ්ඩාගාරික බතකගේ පුත් අයිසයිහ හා නාවිකයෙකුවූ 'නක' අමරතන කෙතවලක නම් වැවේ තම පියාට අයත් කොටසින් දියබද්ද හා තවත් බදු දෙකක් විහාරයට පරිත්‍යාග කළ බව සඳහන් වේ.[69] තමන්ට අයත් වැව් ආදියෙන් බදු අය කර ගැනීමේ හැකියාව පුරවැසියන්ට පැවති බව මෙයින් සනාථ වේ.

පරම්පරාවෙන් හිමිවූ දේ ප්‍රවේණි වශයෙන් හඳුන්වා තිබේ. ශිලාලේඛනයන්හි පරම්පරාවෙන් හිමි වූ දේ **'පමුණු'** වශයෙන් හඳුන්වා දී තිබේ. සිව්වන කාශ්‍යප (ක්‍රි.ව. 894-914) රජුගේ කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති පුවරු ලිපියට අනුව පමුණු වශයෙන් ලබා දී ඇති ඉඩම් කොටසක් පිළිබඳව සඳහන් වේ.[70] දේපළවල අයිතිය පරම්පරාවෙන් ආ විට පමුණු වශයෙන් සැලකූ බව නිශ්ශංකල්ල රජුගේ පොළොන්නරුව ගල්පොත පුවරුලිපියෙන් පැහැදිලි වේ.[71] පමුණු වශයෙන් පැවති ඉඩම් භුක්තිය ඒ පරම්පරාවට හිමි වූ බව එහි සටහන් වේ. මේවාට රජුගෙන් බාධාවක් ඇති නොවී ය. ඒවා අයිතිකරුවන්ට සිතැඟි පිරිදි පාලනය කර ගෙන යාමට අවශ්‍ය බලය රජු විසින් ලබා දී තිබිණ.

පුද්ගලයින්ට පමණක් නොව ආයතන සඳහා ද ඉඩම් මිලදී ගැනීමට හැකියාවක් පැවති බව හිඟුරේගල ගිරි ලිපියෙන් සනාථ වේ. එහි බොහෝ ජනයා එක්ව මුදල් එකතු කොට ඉඩම් මිලදී ගෙන විහාරයට පූජා කොට තිබේ.[72] විහාරස්ථානවලට අයත් වූ ඉඩම් ආදිය රාජ්‍ය භාගයෙන් නිදහස්ව භුක්ති විඳි ආකාරයක් ද සනාථ වේ. රඹෑව ටැම් ලිපියේ සඳහන් වන්නේ සෙන් සෙනෙවිරද් පිරිවෙණට කළ ඉඩම් පරිත්‍යාගයක් පිළිබඳව යි.[73] එහි රාජ්‍ය නිලධාරීන්ට ද ඇතුළුවීම තහනම් කොට ඇති අතර රාජ්‍ය භාගයෙන් ද විනිර්මුක්තව භුක්ති විඳීමේ නිදහස



පනවා තිබූ බව සනාථ වේ. මෙය ආදායම් බද්දෙන් නිදහස් කිරීමකි.

අනුරාධපුර යුගයේ ක්‍රියාත්මක වූ ඒ ඒ නිකායයන්ට අයත් වූ සංඝ සන්තක දේපල වෙන් වෙන් වශයෙන් නම් කොට තිබූ බව සනාථ වේ. ඒවා නිදහසේ භුක්ති විඳීම සඳහා අවකාශ රජ දරුවන් විසින් සකස් කොට දී තිබිණ. බුද්ධන්නේහෙළ පුවරු ලිපියේ සඳහන් වන්නේ විහාර සන්තක දේපළ රාජ්‍ය නිලධාරීන්ගේ බාධාවන්ගෙන් තොරව හෙවත් බදු ගැනීම් ආදියෙන් තොරව පරිහරණය කිරීමට අවකාශ සලසා දී තිබූ බව යි.[74] මීට අමතරව විහාර සන්තක පමුණු ඉඩම් අන් අයට නොදියයුතු බව සිව්වෙනි මිහිඳු (ක්‍රිව.956-972) රජුගේ මිහින්තලා පුවරු ශිලා ලිපියෙන් සනාථ වේ.[75] එහි දක්වන්නේ විහාරස්ථාන සඳහා විශේෂ වශයෙන් ලබා දී ඇති පරිභෝගයන් එම විහාරස්ථානවලම අවශ්‍යතා සඳහා භාවිත කළ යුතු බව යි. වෙනත් ලෙසකින් දක්වතොත් රාජ්‍යයේ විශේෂ විධිවිධානයන් මගින් ලබා දී ඇති වරප්‍රසාදයන් ප්‍රවේශමෙන් පරිහරණය කළයුතු බව මෙයින් ප්‍රකාශ වේ. මේ බව රජ කුලයේ අය වුව ද ක්‍රෝධයෙන් විහාර සන්තක දේ පැහැර නොගතයුතු බව දැක්වෙන පස්වන කාශ්‍යප (ක්‍රි.ව.914-923) රජුගේ අනුරාධපුර පුවරු ලිපියෙන් සනාථ වේ.[76] එයින් කියවෙන්නේ නීතිය සෑම අවස්ථාවක ම මූලිකස්ථානයෙහි ලා සැලකූ බව යි.

### නීතියේ ආධිපත්‍යයය

මිනිස් අයිතිවාසිකම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඉතා වැදගත් කරුණක් වන්නේ නීතියේ ආධිපත්‍යයය ස්ථාපනය කිරීම යි. නීතිය අන් සැමට වඩා ඉහළින් තැබිය යුතු බව මෙහිදී අවධානයට බඳුන් විය යුත්තේ ය. රාජ්‍ය පාලනයේදී ශ්‍රී ලාංකීය රජවරුන් විසින් නීතිය කැමති කැමති පරිදි අර්ථ දැක්වීමෙන් ද නීතිය කඩා බිඳ නව නීති සැකසීමෙන් ද වැලකී සිටි බව අභිලේඛන සාක්ෂි මගින් තහවුරු වේ. රජදරුවන් විසින් නීති ස්ථාපනය කරන ලද බව සිව්වන මිහිඳු රජුගේ වේවැල්කැටිය ශිලාලේඛනයෙන් සනාථ වේ.[77] එයින් කියවෙන්නේ ඒවා

නීතිගත කරන ලද බව යි. තව ද මෙකී නීති ස්ථාවරව ලියා තබා තිබූ බව ද සනාථ වේ.[78]

මීට අමතරව නශ්ශංකමල්ල රජුගේ ප්‍රීතිදාන මණ්ඩප ශිලාලේඛනයෙහි දැක්වෙන්නේ නීති නැවත නැවත පැනවිය නොහැකි වන ලෙස ස්ථාවර කොට තිබූ බව යි.[79] ඒ සඳහා ඒවා ලියවා තැබූ බව එම ශිලාලේඛනයෙහි සඳහන් වේ. නීතියේ ආධිපත්‍යය නිබඳව ම ස්ථාවර වීම එම නීති ක්‍රියාත්මක කිරීමේදී හා ඒවාට අවනත වීමේදී අත්‍යවශ්‍ය සාධකයක් වේ.

## නිගමනය

නූතනයේ 'මානව අයිතිවාසිකම්' පිළිබඳව ලෝකයාගේ අවධානය යළිත් යොමුව තිබේ. ඒ මානව අයිතිවාසිකම් පිළිබඳව නූතන මිනිසා දක්වන ආකල්පය නැවතත් ප්‍රශ්නකාරී මට්ටමකට පත්ව ඇති නිසා ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බැලීමේ දී ඓතිහාසිකමය වශයෙන් ඒකාධිපති රාජ්‍ය පාලනයක් පැවති වකවානුවලදී ද රජවරු ඒ පිළිබඳව බෙහෙවින් සංවේදී වූ ආකාරය පැහැදිලි වේ. බොහෝවිට සිය අණසක පිළිබඳව සිතනවාට වඩා මිනිසාගේ අයිතිවාසිකම් පිළිබඳව අවධානය යෙදවූ බව අභිලේඛන ආශ්‍රයෙන් පැහැදිලි වේ. රාජධර්මයන් නීතියේ ආධිපත්‍යය තුළ ස්ථාපනය වීමට සැලැස්වීම පිළිබඳ පැහැදිලි අදහසක් ශ්‍රී ලංකාවෙන් ලබා ගත හැකි ය. ඒ අනුව මිනිසාගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා වන අයුරින් ක්‍රියා කිරීමට රජවරු ක්‍රියා කොට ඇත. මෙයින් සනාථ වන්නේ ශ්‍රී ලාංකේය ඓතිහාසික යුගයේ රජවරුන් භුක්තිවිඳි බලය හා අධිකාරය නීතිමය මූලධර්ම මත ස්ථාපනය වී පැවති බව යි.

## ආන්තික සටහන්

1. "යත්‍රහි නාම අදින්නාදානං පඤ්ඤායිස්සති ගරහා පඤ්ඤායිස්සති, මුසාවාදො පඤ්ඤායිස්සති, දණ්ඩදානං පඤ්ඤායිසස්ති. යන්නූන මයං ඒකං සත්තං සමම්න්තෙය්‍යාම, යො නො සම්මා ඛියිතබ්බං ඛීයෙය්‍ය, සම්මා ගරහිතබ්බං ගරහෙය්‍ය, සම්මා පබ්බාජෙතබ්බං පබ්බාජෙය්‍ය, මයං පනස්ස සාලීනං භාගං දස්සාමා ති" දීඝ නිකාය, තෘතිය භාගය, අග්ගඤ්ඤ සූත්‍රය, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ධර්මචක්‍ර පදනම, ජේරුකාන පාර, වීදාගම, බණ්ඩාරගම, 2006, පි.156



2. මජ්ඣිම නිකාය, වාසෙට්ඨ සූත්‍රය, බද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ධර්මචක්‍ර පදනම, ජේරුකාන පාර, වීදාගම, බණ්ඩාරගම, 2006, පි.705
3. The new Encyclopedia Britannica, Vol.06, Encyclopedia Britannica Inc. 15th Edition, U.S.A., 1997, p. 137
4. *the Royal chief Secretary – the sforesaid gentlemen, inclusive of all named , having come here , this stone (bearing) a determination of Rights has been set up.*.Paranavitana S. Godakumbura C.E., Epigraphia Zeylanica, Vol. V, Part II, Department of Archaeology, Ceylon, 1963, p.195
5. Epigraphia Zeylanica, Vol. I, Wickramasinghe, D.M. De Z., Published for the government of Ceylon by Henry Frowde Oxford University Press, London, 2012, p.45. Trans. p.56
6. වත්හිමියන් සෙයිගිරි වෙහෙර්හි පෙර තිබූ සිරිත් නිජ රුස්වා ගෙන මෙ වෙහෙරට් මෙ සිරිත් තුබුව වටි. Wickramasinghe, D.M. De Z., Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Henry Frowde Oxford University Press, London, 2012, p.85. Trans. p.99
7. වතු පැනට් වැද අනියා නොකටයුතු ගස්කොළ් නොකැපිය යුතු.. –ibid- p.87. Trans. p.105
8. '..නුවරට නැගෙනහිර කාලවේල යක්ෂයා පිහිටවී හෝ කාලවේල යකු දෙවොළ ඉදි කළේ ය. ඒ චිත්‍ර රාජයකු අභියගිරි යට බාගයෙහි වාසය කරවී. යක්ෂ යෝනියෙහි උපන්නා වූ පූර්වෝපකාරී වු ඒ දාසිය නුවර දකුණු දිග් දොර කෙළෙහි ගුණ දන්නා ඒ තෙම වාසය කරවී. වළවා මුඛ යකිණි රජ ගෙවුයත් ඇතුළත වැස්වී. ..බටහිර රැජන ද වෙසවුණුයා (දෙවොල) ද වැදි දෙවියා තල් දෙවොල ද සභාග වස්තුව ද ප්‍රභේද ලෙය ද යන මෙතෙක් දැ", මහාවංශය, 10 පරිච්ඡේදය, සිංහල පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවන්තුඩාව පඬිතුමන්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල, 2012, පි.45-46
9. පරණවිතාන සෙනරත්, "බුද්ධාගම පිහිටුවීම", ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, I භාගය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනය, (1964) පි.133
11. මහා කළු සිංහලයා පලායෙයි කියා අතිශයින් හඬගෑය", මහාවංශය, 33 පරි.45 ගාථාව , සිංහල පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවන්තුඩාව පඬිතුමන්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල, 2012, පි.141
11. kaiḶāsam Sri Vijayarāja - īśvaram -uḌayākku……irukkum brāhmaṆam ……Paranavitana S. "A Tamil Slab- Inscription from PālamōṬṬai" Epigraphia Zeylanica, Vol. IV, Published for the Government of Ceylon by Humphirey Milford, Oxford university Press, Amen House, 1941,p.194
12. for (maintaining) one secred perpetual lamp given, so that it may last and burn as long as the moon and sun (endure) , to the Lord Vikkirama Calāmēga-Isévara alias Vikkirama-Calāméga-pura..Paranavitana S."Two Tamil Pillar Inscriptions from Budumuttava" Epigraphia

Zeylanica, Vol. III, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C.1933,p.311

13. නිශ්ශංකේශ්වරය යන දෙවාලයක් ද කරවා මෙසේ කළ නො එක් වික්‍රමයෙන්..Wickramasinghe Don Martino De Silva, "Kantalai Gal-Asana inscription of Kitti Nissankamallla", Epigraphia Zeylanica, Vol. II, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1927,p.285
14. විළුවන වෙහෙර්හි පහා යැළින් කරා නිල්පහාහි බොසත් පිළිබිබ් කන්මුවා කරා..Wickramasinghe Don Martino De Silva, "Slab Inscription, No.1& of Mahinda IV, Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1912,p.219
15. Marayu Vahahapa Vasana ulavadha Sadeva Ganayama..Paranavitana S. "Inscriptions Near 'Burrows Pavilion' " Epigraphia Zeylanica, Vol. IV, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord University Press, Amen House,1941&,p.139
16. ''..ඒ තෙමේ කපිල ඇමතියා ලවා වෛතුල්‍යවාදය මිරිකා පාප නිග්‍රහ කරවා බුදු සස්න ද බැබලවී ය.'' මහාවංශය, 36 පරිච්ඡේදය, සිංහල පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවන්තුඩාව පඬිතුමන්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල, 2012, පි.157
17. "..*kasmira, gamdhāra, chína, chilāta, tosāli, avaramta, vamya vanavasi, Yavana, dhamila palura thambapamni, dípa pasadakānam theríyanam thambapamnakanam sapurigahe*" Vogal J.P.H., Prakrit Inscriptions from Buddhist Site at Nagarjunakonda, Epigraphia Indica, Vo.XX, New Delhi, Director Genaral, Archaeological Survay of India, 1983, (reprint),p.22
18. පිරිවෙන් ලද්දන් තමනට් පිරිකැප්පූ මෙපසමුත් පිරිවෙනැ ඇතුළ් බැහැර යම් කවරි පසයක් තුමනට් පිරිබොකළ සඟුන් සම්දරුවන් හින්දැ විචාරකොට් අවසින් පහකරනු ඉසා..Wickramasinghe Don Martino De Silva, "Anuradhapura Slab Inscription of kassapa V, Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford University Press, Amen House, E.C, 1912,p.45
19. "..nada tera ceta vaditaAkuja (k)abikujarana samatavaya catara dorahi patagaḌa ataḌi.."Paranavitana S.,Kataragama Slab Inscription of Nanda Thera, Inscriptions of Ceylon, Vol. II, Part II, Published by the Archaeological Suravay Depatment of Sri Lanka, 2001, p.270
20. තුන් නකාහි සඟරුවන් සමග කරවා .....(ඇතුලත් බාහිර) ශාස්ත්‍ර ද පවත් කරවා පෙර රජු(න්දවස)... Wickramasinghe Don Martino De Silva, "Dambulla Rock Inscription of Kirti Nissankamalla", Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p.130



21. "Bata śagaralitaśa leṆe PaṬibana kuṬe śagaśa" වශයෙන් එය කුඩුම්බිගල සිව්වන ශිලාලේඛනයෙහි යෙදී තිබේ. මෙය මීට අමතරව ගෝනගල තෙවන ශිලාලේඛනයෙහි හා රාජාංගණයේ හත්ථිකුච්ඡි විහාරයේ පළමු ශිලාලේඛනයේ ද යෙදී තිබේ. Paranavitana S. Inscriptions of Ceylon, Volume I, Published by the department of Archaeology Ceylon, 1970, p.39
22. ''බණ් වජාරන දමිනට් ඉසා ඇදුර දමිනට් ඉසා දමින් සජනක්හට් ඉසා...'', "Tablets of Mahinda IV at Mihintale", Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p.89
23. ''.. පිළුන්ට ද, වදන ගැහැනුන්ට ද, අන්ධයන්ට ද, රෝගීන්ට ද මහත් භෝග ඇති ශාලාවන් ද, දන්හල් ද කරවී..'' මහාවංසය, 37 පරිච්ඡේදය, සිංහල පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවන්තුඩාව පඬිතුමන්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල, 2012, පි.171
24. ''..සතුන් කෙරෙහි අනුකම්පා කළේය. මහ නුවණ ඇති ඒ රජ තෙමේ දිළින්දන් වස්තු දීමෙන් ද, සුවපත් වූවන් භෝග ජීවිත රක්ෂණයෙන් ද, ...සත්පුරුෂයන් සංග්‍රහයෙන් ද, අසත්පුරුෂයන් නිග්‍රහයෙන් ද, ගිලනුන් වෙදකමින් ද..'', -එම- පි.167
25. ''..භෝග උපදනා ගමන් යුක්ත කොට (වෛද්‍ය ශාලාවක් කරවීය). කුදුන්ට ද අන්ධයන්ට ද, ඒ ඒ තන්හි ශාලාවන් ද කරවී. -එම- 49 පරි. පි 221
26. ''..හෙතෙමේ කුදුන්ට බලවී වූ ගොනුන් දින, දයාවෙන්වූ ඇළුනාවූ හේ තෙමේ කවුඩු බලු ආදීන්ටත් බත් දින...අඳ දනන්ට ද, පිළුන්ට ද වෙන් වෙන් වශයෙන් ගම් ද දින,.. අනාථ වූ වැන්දඹු කුලඟනන්ට සුදුසු පරිද්දෙන් ගම් බත් වත් දින, -එම- 60 පරි.,පි.265
27. ''..මේ මාගේ දාගැබෙහි කර්මාන්ත කරන ගිහිවූවත් තපස්වීන් වහන්සේ වූවත් සිත්වූ පරිද්දේන් මෙකී සියල්ල අනුභව කොට කළ කර්මාන්තයෙහි මිල නොගෙන නොයත්ව යි.., සිතියම් සහිත ථූපවංශය, ඩී.ජේ.බී. විජයශේකර සංස්. පී.ජේ. කරුණාධාර, කරුණාධාර මුද්‍රණාලය, මරදාන, කොළඹ, 1957, පි.148
28. මහාවංශය, 36 පරිච්ඡේදය, සිංහල පරි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හා බටුවත්තුඩාව පඬිතුමන්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල, 2012, පි.157
29. -එම- පි.168
30. ''..අනුරාධපුර පොළොන්නරුව ද උවදුරු රෝග නසන පිණිස වෙදහල් කරවී....ඒ තෙමේ නුවර ඒඒ තන්හි බෙහෙත් ගෙවල් කරවී. .. බන්ධනගත බොහෝ තිරිසනුන් මිදවී. -එම- පි.239
31. ''.. ඉක්බිති කරුණාබර නරේශ්වර තෙමේ නොයෙක් සිය ගණන් රෝගීන්ගේ වාසයට සුදුසු වූ මහා ශාලාවක් කරවා යට කී ක්‍රමයෙන් එහි ද සියලු උපභෝග සාමග්‍රිය තබ්බවා සියලු රෝගීන්ට එකෙක් පාසා දිවා රාත්‍රී දෙක්හි පොහොන පමණින් බෙහෙත් හා කැඳ යුතු බිඳියයුතු ආහාරාදිය ද..'' -එම- 73 පරි. පි.337
32. "...śa puta vejha Tiśaha lene", Paranavitana S, Inscriptions of Ceylon, Vol.I, Published by the Government of Archaeology, Ceylon, 1970, P.51
33. Maharajhaśa Devanapiyaśa GamiṆi Tiśaśa vejha BamaṆa Gobutiya LeNe śagaśa", Paranavitana S, Inscriptions of Ceylon, Vol.I, Published by the Government of Archaeology, Ceylon, 1970, P.83

34. "..Upasaka Veja Mitaha puta…",-ibid, p.98
35. ''..(වැගු)ණ මහා (රා)දයන් බමුණ් කුම්බරබ් බෙහෙද් ගෙට් දූන අතුර් මෙගිරිවත්ත...'' "Kiribath Vehera Pillar Inscription", Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p.158
36. "..mahāle Senalnākan Kärävū timbiriget mecum tama dun Utr pasä..", "Colombo Museum Pillar Inscription", Paranavitana S, Epigraphia Zeylanica, Vol. III, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C.1933,p.273-274
37. ''ඇත් නකරෙහි දෙබිසෙවැ දා කසුබ් රද්පා කරවූ වෙද්ගළ බද් එළ්හම්බිම ආවූ බලපු'', ''Two pillar Inscriptions from Dorabawila", Godakumbura C.E., Epigraphia Zeylanica, Vol.V, Part. II, published by the Government of Ceylon,1963, p.292
38. -ibid- p.296
39. ''..මෙතුවාක් දෙනමො එක්සෙවැ මහවෙදනා පුනල්නාවනට් මහකරබැ පැයැල ආ..'', ''Two pillar Inscriptions from Dorabawila", Godakumbura C.E., Epigraphia Zeylanica, Vol.V, Part. II, published by the Government of Ceylon,1963, p.304
40. ''..වෙද්ගල්කැමියන් වෙහෙර්බිමැ වෙද්ගල් කුඩින් ලවා (ගොවිකම්) නොකරවනු ඉසා, (වෙහෙර්කැමියන්) වෙද්ගල් බද් ගම්පබිමැ තමන් ගොවිකම් නොකරනු ඉසා, වෙද්ගල් (සතු ගෙ)වතු නොගන්නා ඉසා සරකයේ ගොන් මීවුන් නොගන්නා ඉසා කුඩීන්ගෙන් අත්ලස් පඬුර් නොගන්නා ඉසා වෙද්ගල්කැමියන් ...''"Madirigiri Slab Inscription of Mahinda VI", Paranavitana S., Epigraphia Zeylanica, Vol. VI, Part I, Published by the Archaeological Department of Ceylon, 1973, p.49
41. ''...වෙදක්හට් දෙතිසැසෙණෙන් තියපැළියාක් ඉසා දම්යෙන් වසගක් ඉසා පුහුඩා වෙදක් හට් දෙපයක් ඉසා දම්යෙන් වසගක් ඉසා ..'', "The two Tablets of mahinda IV at Mihintale" Wickramasinghe, D.M. De Z, Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p.89
42. ''..නොයෙක් දෙසින් රැස්වූ මහණ බමුණු කණ පිළු කුරු කුදුන් ආදී වූ දී ආනාථ ජනයන් සනාථ කොට මෙසේ චතුසස(ග්‍ර)හවස්තුයෙන් ලෝකශාසන සනහා..'', "Polonnaruva – 'Galpota' Slab Inscription", Epigraphia Zeylanica, Vol. II, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1927,p.106
43. "Nakaravaviya (varupatahi) vaḌaman ketahi tipati ca ….(tumaha) pata gamaka nakaraka...", Paranavitana S., Inscriptions of Ceylon Vol.II, part II, "A Rock Inscription from Puvarasankulam", Published by the Archaeological Suravay Department, 2001, p.173



44. ''..රජ් වෙද්හල් කරය් රොව් බිය සමය් පොදොනවුලු පුලුඩාවුලුයෙන් කෙදන් කම් සුලබ් කොට් සිරිලක් ලොන්දුර්වය් සා බිය නිවය් රට් සොරත් සැත් බිය නොරැ නන් ජැයින් නන් සෙස්...''"Anuradhapura Slab Inscription of Kassapa V", Epigraphia Zeylanica, Vol. I, Wickramasinghe, D.M. De Z, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p.43
45. ''..තුලාභාර නැගී මහා නවරත්න දානවර්ෂා පවත්(වා) දිළින්දු භය දුරු කොටැ බොහො ඇළ අවුණු වැව් බන්දවා දුර්භික්ෂභය දුරු කොටැ..'', "Polonnaruva Priti Danaka MandapaInscription", Epigraphia Zeylanica, Vol. II, Wickramasinghe, D.M. De Z, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1927,p.169
46. ''..නොඑක් තැන ධර්මමාධිකරණ ලවා අන්‍යායන්නිවාරණ කොට..'', –ibid-
47. ''..උපන් දැයට් පැ හැකිසෙ ලියා තබා මැරුවෙහහු මරා පට්වනු කොට් ඉසා ..'', "Vevalkatiya Slab Inscription of Mahinda – IV", Epigraphia Zeylanica, Vol. I, Wickramasinghe, D.M. De Z, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912,p. 245
48. ''..කඩ පලා සොරුම් ගත් අයනියෙන් නියත කළොත් තිරූ කොට් අයනිය (හි)මිහට් ගෙනදී එල්වන් කොට් ඉසා ති රැ නොකළ දසගම ඇත්තන් පන්සාලිස දවසකින් සොයාගෙනැ පට්වනු කොට් ඉසා සොයා නොගත දසගමින් එක්සිය පස්විසි කළන්දක් රන් රදොලට් දෙනු කොට් ඉසා..'' -ibid-
49. ''..මරා කෙටූ වරදට් දඩ් නොගෙනැ රට වූ උල්පාඩුවක් හට් දක්වා දෙනු කොට් ඉසා..'', "Kondavattavan Pillar Inscription of Dappula V", Paranavitana S., Eoigraphia Zeylanica, Vol.V, Part. I, published by the Government of Ceylon,1963, p.136
50. ''..කොටාවන්නන් නොගන්නා ඉසා ලා නොරක්නා ඉසා..'', those who have committed should not be received , nor should they be kept and protected.., ''Two pillar Inscriptions from Dorabawila", Godakumbura C.E., Eoigraphia Zeylanica, Vol.V, Part. II, published by the Government of Ceylon,1963, p.296
51. "..bährä mini koṬā no väddä denu isā raṬä hindä mini ke(Ṭu)va kämiyan unge gedaḌ genä piṬt karanu isä.." (Those who came) after committing homicide outside are not to be given admission. Should (tenants) commit homicide in the district the employees should take their *gada*Ḍand send them away" KaludiyapokuṆa inscriptions, Epigraphia Zeylanica, Vol. III, Paranavitana S.,Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1933,p. 267
52. මෙහි 'දම්බදිව්' යන්න වික්‍රමසිංහයන් අර්ථ දක්වා ඇත්තේ 'දඹදිව' යන අර්ථයෙනි.
53. minI keṬū kenekun äta gamaṬ vädä ovn mä illat-mut sės ehi no pahaḶ sesu kuḌīnaṬ aniyā no karan isā", Anradhapura Sla Inscription of

Kassapa V, Epigraphia Zeylanica, Vol. I, Wickramasinghe, D.M. De Z, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912, p. 47

54. -ibid- p44
55. "ovn mä illat-mut ses ehi no pahaḶ sesu kuḌīnaṬ aniyā no karan isā", Anradhapura Sla Inscription of Kassapa V, Epigraphia Zeylanica, Vol. I, Wickramasinghe, D.M. De Z, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912, p. 47
56. "väḶätä vana uḶvāḌu kaṆakkarun gamaṬ ākula no karanu isā", Badulla Pillar Inscription, Epigraphia Zeylanica, Vol. III, Paranavitana S., Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1933, p.79
57. "me hämhi keṬū (ke)nekun äta gämiṆ piṬat karanu isā koṬā nannavun vädä no (gann) nā asā", Moragoda Pillar Inscription of Kassapa IV, Wickramasinghe, D.M. De Z, Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912, p.205/207
58. "(කොටා) වන් ගැමින් පිටත් කරවා ගනුත් මිසැ ගම වැදැ නොගන්නා ඉසා", Mädirigiriya Pillar Inscription, -ibid- p29
59. "(sataḶos vhanse) davasä kaḶa sisrtak misä annnäyen karana däyak nokarnā sätiyaṬ", Badulla Pillar Inscription, Epigraphia Zeylanica, Vol. III, Paranavitana S., Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1933, p.75
60. "hind(ä si)vū vävasthā sirit", -ibid-
61. "pere- sirit daḌa ganut misä ani(yā) no karanu isā", ibid-
62. "mandraṆḌin hindä (v)itāra koṬ piri kapā dakvā dun daḌa gant misä gam vaṬā genä getirä genä daḌa no iḶvanu isā", ibid-
63. "Ḷi daḌat savāmi ginut misä abu-druvan väläkme no gannā isā", -ibid-
64. "me vävastā ikmä gamaṬ radolan aniyā kaḶa sabhāye lekam gryi daruvan Ṭa kiyā (a)vul haravā", -ibid-, p77
65. Sabaraja Ekadorika viharahi pohotakara karvaya Upaladonika vavi pacasata(hiya) kiṆiya.. Paranavitana S. Inscriptions of Ceylon, Vol.II, Part. I, Published by the department of Archaeology, Sri Lanka, 1993, p 60
66. Maharaja Gamani Abayaha mata Kubaragama – vavi tumaha dana daraya catara sahasa kahavana dariya..ibid- p98
67. ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, II භාගය, හේමචන්ද්‍ර රාය සංස්. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය, 1972, රාජවංශ සටහන II



68. පණ්ඩිත ඒ බිසව් බිම පිණිස මහා විහාරයට ලක්ෂයක් දුන්නීය. විහාරය ද කරවී, ...ඒ ඒ තැනින් මිලට ගෙන සංඝ භෝග ද දුන්නීය, ම.ව. 35 පරි. 118-119 ගාථා. ශ්‍රී සුමංගල හිමි හක්කඩුවේ, දේවරක්ෂිත බටුවන්තුඩාව, සිංහල පරි. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල8 වැනි මුද්‍රණය 2012,
69. "baḌakariya batakayaha puti Ayi Sayiha navaka Nakayaha….dakapati tumaha pita sataka kotasahi eka kotasa..", Paranavitana S. Inscriptions of Ceylon, Vol.II, Part. I, Published by the department of Archaeology, Sri Lanka, 1993, pp 66-67
70. GaṆagamiyehi pamṆu käbälla(d) ra(d)kolen..", Colombo museum pillar inscription of Kassapa IV, Paranavitana S, Epigraphia Zeylanica, Vol. III, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C.1933, p.274
71. "..devel vahal sarak pamuṆu parapuru ran ridī.." "Polonnaruva – 'Galpota' Slab Inscription", Epigraphia Zeylanica, Vol. II, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1927, p.110, he appointed ministers and other (officials) and provided them with 'livings' surfs, cattle, permanent grants,..-ibid- p 117
72. "..clasa kahavaṆa araba vahara atasamana atana ma bala gaṆa Baha…atra avaṆaha dayana kara .." Hiṅguregala Rock inscription, Paranavitana S., Epigraphia Zeylanica, Vol.V, Part. I, published by the Government of Ceylon, 1963, p.117
73. "..Sen sẹnevirad pirivenaṬ vadāḶa Gälenduru GomaṆḌala satar payaḶat de-kam-tän-deruvanā no vadna kot…mahvar rad – kol kämiyan no vadna kot isa.., Rambāva Pillar Inscription, Wickramasinghe, D.M. De Z, Epigraphia Zeylanica, Vol. I, Published for the Government of Ceylon by Humphiirey Milford, Oxford university Press, Amen House, E.C, 1912, p.174
74. "…me sa-kiriyehi- kĕbĕli no gannā koṬ isā veher kĕbali no gannā koṬ isā diya bedum no gannā koṬ isā .."- ibid- p.197
75. "…me eherhi badtuvāk gam bim kavru pariyāyen ukas pamuṆu no diyā yutu isa gatuvan ranā no hmi koṬ veheraṬ mē navatā gate yutu isā.." – ibid- p.97
76. "…rj-kolen bahā Buj sasnehi anusasē bäṆdā dun pamuṆu udahaasē no gannā isā.." – ibid- p.47
77. "…sam daruân visin me vävastā karan ladi.." vevalkatiya pillar Inscription, - ibid- p.248

78. "…ättan hindä vicārā upan däyaṬ pä häkiss liyā tabā..", -ibid- p.247

79. "…no ek tänä DharmmādhikaraṆa lavā anyāyan nivāraṆa koṬä taman-vahanse samṚddha koṬa lū lo vässan anācāra koṬä no-nasnā piṆisä raja(dhāniyehi) sadācāra śilāläkha karavā..", Wickramasinghe Don Martino De Silva, "Polonnaruva Priti-dana mandapa Rock Inscription", Epigraphia Zeylanica, Vol. II, Published for the Government of Ceylon by Humphiirey Milford, Offord university Press, Amen House, E.C, 1927,p.172